# ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

## මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය - පැලියගොඩ

Procurement No: CFMC/MT/Admin/2026/CIS S

## පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය වෙත කැබලි කරන ලද අයිස් (crushed ice) බෑග් සැපයීමේ හා අලෙවි කිරීමේ සේවාව පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම - 2026/2028

ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ කළමනාකරණ භාරයක් මඟින් පාලනය වන පැලියගොඩ පිහිටි මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය වෙත කැබලි කරන ලද අයිස් (crushed ice) බෑග් සැපයීමේ හා අලෙවි කිරීමේ සේවාව වර්ෂ දෙකක කාලසීමාවක් සඳහා බදු පදනම මත පවත්වාගෙන යාමට පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන ලංසුකරුවන්ගෙන් පමණක් පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරයේ සභාපති විසින්, 2026.06.16 වන දින ප.ව. 02.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

2010 වර්ෂයේදී ආරම්භකර ඇති පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය, වෙළඳකුටි 154 කින් සමන්විත තොග වෙළඳපළකින්ද, වෙළඳකුටි 128 කින් සමන්විත සිල්ලර වෙළඳපළකින්ද, වාහන 500 ක් පමණ ගාල් කළ හැකි රථගාලකින්ද සමන්විත වන අතර වර්තමානය වන විට විශාල ගණුදෙනුකාරභවතුන් සහ වෙළඳ ප්‍රජාවක් විසින් දෛනිකව භාවිතා කරනු ලබන ඉතා කාර්යබහුල ශ්‍රී ලංකාවේ දූනට පවතින ප්‍රධානතම මත්ස්‍ය සැපයුම් ආයතනය ලෙස ආර්ථික වශයෙන් ශක්තිමත් භාවයට පත්ව ඇත.

මෙම වෙළඳ සංකීර්ණය වෙත දිවයිනේ විවිධ ප්‍රදේශවලින් දෛනිකව දළ වශයෙන් මාළු ටොන් 120ක් පමණ රැගෙන එන අතර වෙළඳ සංකීර්ණයේ දෛනික කැබලි කරන ලද අයිස් අවශ්‍යතාවය දළ වශයෙන් ටෝන් 100ක් පමණ වේ.

1. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලබයි.

**ලංසුකරු :-**

2. කැබලි කරන ලද අයිස් සැපයීම සහ අලෙවිය සම්බන්ධ ශ්‍රී ලංකා ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ හෝ සමාගම් පනත යටතේ ලියාපදිංචි වී තිබිය යුතුය.
3. කැබලි කරන ලද අයිස් බෑග් සැපයීම සහ අලෙවිය පිළිබඳ අවම වශයෙන් ආසන්නතම වසර 05 ක් තුළ ලද වසර 03 ක සේවා පළපුරුද්දක් තිබිය යුතුය.
4. සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන් දෙදෙනෙකු (02) පමණක් මෙම සේවාව පවත්වාගෙන යාම සඳහා පළමු සැපයුම්කරු හා දෙවන සැපයුම්කරු වශයෙන් තෝරා ගනු ලැබේ.
5. මෙම සේවාව පවත්වාගෙන යාම වෙනුවෙන් ලංසුකරුවෙකු විසින් වෙළඳ සංකීර්ණ පරිපාලනය වෙත මාසිකව ගෙවිය යුතු අවම සේවා ගාස්තුව රුපියල් ලක්ෂ හයක් (600,000.00) වේ.
6. ලංසු ඉදිරිපත් කළ යුත්තේ අංක 83/1, මීගහවත්ත පාර, පැලියගොඩ යන ලිපිනයෙහි පිහිටා ඇති පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ පරිපාලන කාර්යාලය වෙතින් 2026.06.01 වන දින සිට 2026.06.15 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසුකරු විසින් තම ලිපි ශීර්ෂය සහිත වූ ලිපියකින් ඉල්ලුම් කර ලබා ගත් ආකෘති පත්‍ර මඟින් පමණි. තවද එකී කාල සීමාව තුළදී ඕනෑම ලංසුකරුවෙකු වෙත අදාළ ලංසු ලේඛනයන් නොමිලේද පරීක්ෂා කර බැලිය හැක.
7. ලංසු පත් ලබා ගැනීමට පෙර ආපසු නොගෙවනු ලබන රු.3,500/- ක ලංසු ගාස්තුවක් පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ කළමනාකරණ භාරයේ ගිණුම් අංක 71446342 දරණ ලංකා බැංකු

ගිණුමෙහි තැන්පත් කර අදාළ රිසිට් පත පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ පරිපාලන කාර්යාලයේ ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර මුදල් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

8. මීට අදාළ පූර්ව ලංසු හමුවක් 2026.06.09 වන දින පෙ.ව. 10.00ට ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ ශ්‍රවනාගාරයේදී පැවැත්වේ.

9. සියලුම ලංසු සමඟ 2026.10.12 වන දින දක්වා වලංගු සහ ලංසු ලිපිලේඛන සමඟ දක්වා ඇති ආකෘතියට අනුකූලවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබාගත් ආපසු හැරවිය නොහැකි සහ ප්‍රසම්පාදන අස්තිත්වය විසින් සිදු කරන පළමු ලිඛිත ඉල්ලීම මත කොන්දේසි විරහිතව මුදල් කළ හැකි බැංකු ඇපකරයක් ආකාරයෙන් වන රුපියල් ලක්ෂතුනක (රු.300,000/-) වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. නැතහොත් එකී වටිනාකම හා සමාන මුදලක් පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ කළමනාකරණ භාරයේ ගිණුම් අංක 71446342 දරණ ලංකා බැංකු ගිණුමෙහි තැන්පත් කර අදාළ රිසිට් පත පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ පරිපාලන කාර්යාලයේ ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර එම අංශය වෙතින් නිකුත් කරනු ලබන මුදල් කුවිතාන්සියෙහි මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.

10. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු අයදුම්පත්, 2026.06.16 වන දින ප.ව. 02.00 ට පෙර ලැබෙන සේ

**සභාපති**
**පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය,**
**ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය, දෙවන මහළ,**
**ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය,**
**නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත,**
**කොළඹ 10**

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ, ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ, දෙවන මහලේ මුදල් අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය.

11. ලංසු පත් විවෘත කරනු ලබන අවස්ථාවේ ලංසුකරුට හෝ ඔහු විසින් බලය පැවරූ නියෝජිතයකුට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. 2026.06.16 වන දින ප.ව. 02.00 ට ලංසු කැඳවීම අවසන් කළ වහාම ලැබී ඇති ලංසු පත්, ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ දෙවන මහලෙහි පිහිටි ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

12. මේ සම්බන්ධයෙන් වැඩිමනත් විස්තර පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණයේ ප්‍රසම්පාදන නිලධාරීගේ දුරකථන අංක 011-3301707 ඇමතීමෙන් ලබා ගත හැක.

**සභාපති**
පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය,
ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය,
නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත,
කොළඹ 10.